**හාලිඇල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1. **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ඔක්තෝබර් 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 **මතය**
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හාලිඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) පළාත් පාලන ආයතනවල ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ 2014 වර්ෂයේ සභාවට ලබාදුන් ඩබල් කැබ් රථයේ වටිනාකම රු.6,390,000 ක් වුවත්, එය රු.6,300,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම නොවන වත්කම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු.90,000 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර රු.90,000 ක් හා ප්‍රාග්ධන වියදම් රු.90,000 ක් බැගින් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ මහජන උපයෝගීතාවයන් සඳහා සභාව වෙත ලබාදෙන ලද ගැල්වනයිස් කොඩි කණු 456 ක වටිනාකම වූ රු.450,765 ක් ප්‍රාග්ධනිත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු.450,765 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සභාවට ලබාදෙන ලද බහුකාර්ය ජංගම කුටි 10 ක වටිනාකම වූ රු.265,000 ක් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු.265,000 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,348,570 ක් වූ මුදල් පොතේ ශේෂය රු.11,505,196 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීම නිසා වත්කම් රු.8,156,626 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් ශේෂය වූ රු.4,486,072 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත නොකිරීම නිසා බැරකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ උප ව්‍යාපෘතිය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදල සඳහා ගෙවිය යුතු පොලිය ගෙවිය යුතු වියදමක් ලෙස සටහන් නොකර දේශීය ණය හා සංවර්ධන අරමුදලට බැර කර තිබුණු බැවින්, දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය ශේෂය රු.4,119,926 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ ආදායම රු.7,299,522 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.6,203,951 ක් ලෙස දැක්වීම නිසා ජංගම වත්කම් රු.1,095,571 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) ණයගැති ප්‍රතිපාදන සලසා තිබුණු ප්‍රමාණයට වඩා, සමාලෝචිත වර්ෂය තුළදී වැඩිපුර ලැබී තිබුණු රු.917,596 ක් වූ මුද්දර ගාස්තු සමුච්චිත අරමුදලට ගැලපීම් කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.2,269,346 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.2,088,330 ක් ලෙස දැක්වීම නිසා ණයගැතියන් රු.181,016 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදලේ වාරික හා පොලී ගෙවීම ණයහිමි ගෙවීමක් ලෙස සඳහන් කර තිබීම නිවැරදි කිරීමේ දී ණයහිමි ගිණුම බැරකර පොලී වියදම් ගිණුම හා ණය ගිණුම හර කළ යුතු වුවද, ණයහිමියන් බැර කර සමුච්චිත අරමුදල හර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ශේෂය රු.19,502 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වූ රු.5,413,595 ක් සමුච්චිත අරමුදල් ගිණුමට ජර්නල් සටහනක් මඟින් ගැලපීම් කර නොතිබුණි.

(ඕ) 2013 වර්ෂයේ වැඩිපුර සටහන් කරන ලද හිඟ හිටි ජල බද්ද, සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර ජල බදු ගිණුමට හර කිරීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ජල බදු ආදායම රු.12,053 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**

--------------------------

ගිණුම් විෂයයන් තුනකට අදාලව උපයෝගී ලේඛන අනුව ශේෂය රු.5,175,458 ක් වූ අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව ශේෂය රු.8,066,732 ක් විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල එකතුව රු. 73,754,893 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු.80,867,541 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

රු. 18,050,944 ක් වටිනා ගිණුම් විෂයයන් 04 ක්, උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) | මු.රෙ. 371 | අවස්ථා 11 කදී දෙන ලද අත්තිකාරම් රු.603,605 ක් 2014 සැම්බර් 31 වන විටද පියවාගෙන නොතිබුණි. |
| (ii) | මු.රෙ. 396(ඇ) | නිකුත් කර මාස 06 ඉක්ම වූ රු.31,318 ක් වටිනා චෙක්පත් 5 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| xxiv වන පරිච්ඡේදය 1:6 හා 4 වගන්ති | | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලබා ඇති, සේවය අත්හිටවූ හා මියගිය සේවකයින් / නිලධාරීන් 16 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු.159,713 ක් වූ සේවක ණය අයකර ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,061,622 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,421,364 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,359,742 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 7,299,522 |
| මුද්දර ගාස්තු | 2,269,346 |

2.2.2 ජල ගාස්තු
---------------

(අ) රු.200 ක මාසික ස්ථාවර ජල ගාස්තුවක් අයකරන බෝගහමඩිත්ත ජල යෝජනා ක්‍රමයට අයත් පාරිභෝගිකයින් 72 ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.266,400 ක් වූ අතර, ඒ තුල වූ පාරිභෝගිකයින් රැසක් දීර්ඝ කාලයක සිට ගාස්තු ගෙවීම පැහැර හැර තිබුණි.

(ආ) සභාව සතු නිල්බෝවිල ජල යෝජනා ක්‍රමය යටතේ 2014 දෙසැම්බර් 31 දිනට පාරිභෝගිකයින් 76 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය රු.171,440 ක් විය. ඒ තුල රු.4,500 ඉක්මවා හිඟ ශේෂ පවතින පාරිභෝගික සංඛ්‍යාව 12 ක් වූ අතර, එම හිඟ ශේෂ අයකර ගැනීමේ විධිමත් වැඩ පිළිවෙලක් සභාව විසින් සකස් කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**
---------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**
----------------------------------

2013 හා 2014 වර්ෂවලට අදාලව සිදුකරනු ලැබූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතුවලදී සභාවේ ප්‍රධාන කාර්යාලයට අයත් රු.206,090 ක් වටිනා අයිතමයන් 26 ක ඌණතාවයක් සමීක්ෂණ මණ්ඩලය විසින් හඳුනාගෙන තිබූ නමුත්, ඒ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. **පද්ධති හා පාලන**
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය